# 5. ජේසුස් වහන්සේ හා ජුදෙව් චාරිත්‍ර

**ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ව සමදර්ශක ශුභාරංචිවල ඉතා කෙටි සටහන් කිහිපයක් පවති යි. ඒවා අතර ජේසුස් වහන්සේ වෙනුවෙන් මව්පියන් ඉටු කළ ජුදෙව් පිළිවෙත් කිහිපයක් ලූක් තුමා වාර්තා කොට තිබේ. නමස්කාර ජීවිතයට අදාළ ජුදා ආගමේ ව්‍යවස්ථාව ඔවුන් අනුගමනය කළා සේම, ලාංකික සමාජයක් ලෙසට එක් ව ගමන් කිරීමේ දී පොදු සංස්කෘතික හා ලාංකීක සිරිත් විරිත්වලට ගරු කිරීමට ද මෙම පාඩමෙන් කිතුනු අපටත් මග පෙන්වීමක් ලැබේ.**

**ශු. ලූක් 2: 21 - 52**

ජුදෙව් ආගමික මංගල්‍යයන් ගණනාවක් පැවතුන අතර, එම මංගල්‍යයන් සඳහා, පිළිපැදි අණ පනත් ජුදා ව්‍යවස්ථාව හා ඒකාබද්ධ ව පවතියි. එම නීති නියමයන් සපිරීම සඳහා යම් යම් පිළිවෙත් ඉටු කිරීමට නියමිත ව තිබිණි. මේ සැම පිළිවෙතක් ම ජුදෙව් ඉතිහාසය හා සම්බන්ධ සිදුවීම් පදනම් කොට ගොඩ නැගී තිබේ.

ජුදෙව්වරුන් මේ සියලු පිළිවෙත් ඉතා භක්තියෙන්, කැපවීමෙන්, වැයවීමෙන් හා ගෞරවාන්විත ව හා කීකරු ව සිදු කළහ. මේ තුළින් ජුදෙව්වන් හට සමාජය තුළ "ජුදෙව් අනන්‍යතාවය" සහිත ව ජීවත් වීමට පදනම සැකසුණ අතර එමගින් ඔවුහු එකමුතු ජන කණ්ඩායමක් බවට පත් වූහ.

ජුදෙව් ජනතාවට ආවේනික, නීති නියමයන් රකිමින්, මරියතුමිය හා ජෝසෙප්තුමා තම පුත්‍රයා සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති බව පෙනී යයි. චර්මඡේදන පිළිවෙත මීට උදාහරණයකි.

## චර්මඡේදනය

චර්මඡේදන පිළිවෙත ඉශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසය සමග ඉතා ගැඹුරු ලෙස සම්බන්ධ ව පවති යි. ඉශ්‍රායෙල්වරුන්ගේ ආදි පිතෘ ආබ්‍රහම්තුමා හා ඉන් මතු පරපුරට අදාළ වන ලෙසට මෙම නියෝගය දෙවියන් වහන්සේ විසින් ම ලබා දුන් සේක.

චර්මඡේදන පිළිවෙත කරණකොට ගෙන ජුදෙව් ජනතාව, "දෙවියන් වහන්සේට සන්තක වීමේ" තත්ත්වයට ඇතුලු වෙති. එය එම අදහස ප්‍රකාශ කිරීමේ බාහිර සංකේතයක් වන නමුදු, පුද්ගලයාගේ ශරීරය තුළ එය දැරීමෙන්, "ජුදෙව් අනන්‍යතාවය" සමාජය තුළ දැරීමට පහසු කර වීය. මෙම නියෝගය ජේසුස් වහන්සේ සම්බන්ධ ව ඉටු කර තිබේ.

## ජේසු බිළිඳාගේ චර්මඡේදන පිළිවෙත

උපත දැනුම් දුන් අවස්ථාවේ දී ගාබ්‍රියෙල් දූතයා "ජේසුස්" යන නාමය බිළිඳාට තබන ලෙස ප්‍රකාශ කළේ ය. සැම ජුදෙව් නාමයකට ම පාහේ අර්ථයක් තිබෙන අතර, "ජේසුස්" යන්නෙහි අර්ථය නම් "දෙවියන්වහන්සේ මුදන සේක" යන්න යි. මේ නාමය උන්වහන්සේගේ මෙසියානු කාර්යභාරය හා මනාව ගැලපී සිටී. ජේසු බිළිඳාට "ජේසුස්" යන නාමය චර්මඡේදන පිළිවෙත කළ අවස්ථාවේ තබන ලදි.

## කුළුඳුලන් කැප කිරීම හා මුදවා ගැනීම

චර්මඡේදනය කිරීමේ නියෝගය ආබ්‍රහම්තුමාගේ යුගය කරා දිවෙන අතර, මෙම නියෝගය නික්මයාම සිද්ධිය හා බැඳී පවති යි. මිසරයේ පීඩිත මෙහෙවරකට පත් ව සිටි ඉශ්‍රායෙල් ජනතාව, මෝසෙස්තුමාගේ නායකත්වය යටතේ, දේව අභිමතය පරිදි, වහල් බැඳුමෙන් මිදී කානාන් දේශයට පැමිණිය හ. වහල්කමින් මිදී මිසර දේශයෙන් පිට වූ රාත්‍රියේ දී ඉශ්‍රායෙල් ජනතාවගේ කුළුඳුල් පිරිමි දරුවන් විනාශ නොවුණි. එම රැකවරණය සිහි කරනු සඳහා ඉශ්‍රායෙල් ජුදෙව් කුළුඳුල් පිරිමි දරුවන්, ඉපදී දින 40 ක් ගත වූ විට දේව මාලිගාවේ දී කැප කරන ලදි. මෙම පිළිවෙත ඉටු කිරීමේ දී පරෙවි පැටවුන් දෙදෙනකු හෝ කොබෙයියන් දෙදෙනකු පූජා කිරීමට නියමිත විය. ජේසුස් වහන්සේ වෙනුවෙන් මෙම පිළිවෙත ඉටු කරන ලදි.

අද කිතුනු සසුන තුළ පවතින විවිධ පිළිවෙත් තුළින්, පුද්ගලික හා සාමූහික ආගමික වාතාවරණයන් ශක්තිමත් කරයි. (උදාඃ- බෞතීස්මය, කැපකිරීම, ශුද්ධ සහභාගිකම ආදී ලෙසට)

මෙලෙස ලාංකේය ජනතාවක් ලෙසට අපට ම උරුම සංස්කෘතිමය අගයයන් ද පවතී. ඒවා කිතුනුවන් හට නිශ්චිත නියමයන් හා නියෝගයන් නොවූවත්, එකමුතු සමාජ ගමනක යෙදීමට ප්‍රයෝජනවත් වෙයි.

(උදාඃ- සිංහල/හින්දු අලුත් අවුරුද්දට අදාළ යම් පිළිවෙත්, අකුරු කියවීම, නම් තැබීම, රන්කිරි කට ගෑම, ගෙට ගෙවදීම, මුල්ගල තැබීම, අසනීප, බෝවන රෝග ඇතිවිට කොළ අතු එල්ලීම යනා දී ලෙසට)

නමුත් කිතුනුවා මේවා භාවිත කිරීමේ දී කිතුනු ඇදහිල්ලට ශු. බයිබලීය පදනමට පටහැනි නොවිය යුතු ය. ඉතා කල්පනාකාරී ව, දෙවියන් වහන්සේට මුල් තැන දෙමින් කටයුතු කිරීම වැදගත් වේ. ලාංකේය ජන සමාජය තුළ කිතුනු බැතිමතුන් අන් අය සමග සාමූහික ගමනක යෙදෙන්නට මෙය උපකාර වනු ඇත.

## ජේසුස් වහන්සේ කැප කිරීම.

කැප කිරීමේ පිළිවෙත ඉටු කිරීමට ජේසු බිළිඳා රැගෙන ආ අවස්ථාවේ දී දේව මාලිගාවේ දී පුද්ගලයන් දෙදෙනකු සිටියා හ. සිමියොන් හා අන්නා යනු ඔවුන්ගේ නම්ය.

| ආත්මික ව පෝෂණය වූ පුරුෂයකු හා ස්ත්‍රියකගේ අත්දැකීම් | |
|---|---|
| **සිමියොන් -**<br>අර්ථය: **දෙවියන්වහන්සේ ඇසූ සේක** | **අන්නා දිවැසිවරිය** |
| ❊ දැහැමි බැතිමතෙකි. | ❊ දේව මාලිගාවේ නිරන්තර යාච්ඤාවේ යෙදී සිටියා ය. |
| ❊ ශුද්ධාත්ම වැඩ විසීම අත්දුටුවෙකි. | ❊ එහි රැඳී උපවාසයෙන් හා යැදුමින් දේව සබඳතාවය අපේක්ෂාවෙන් සිටියා ය. |
| ❊ මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බවට අනාවරණය ලද්දෙකි. | ❊ දේව මාලිගාවේ නමස්කාරයේ යෙදී සිටියා ය. |
| **ප්‍රකාශනයේ වැදගත්කම**<br>❊ ජේසුස් වහන්සේ මෙසියස් බව හඳුනා ගැනීම.<br>❊ මෙසියස් වහන්සේ දෙන ගැළවීම සියලු විජාතීන්ට විවෘත බව.<br>❊ මෙසියස් වහන්සේ තුළින් ඉශ්‍රායෙල් ජාතීන් නොවන අයට ද ජීවිතාලෝකය ලැබෙන බව.<br>❊ මෙසියස් වහන්සේ ඉශ්‍රායෙල් සෙනගගේ මහිමය යි.<br>❊ මෙසියස් වහන්සේ පිළි නොගන්නා අයගේ වැටීම.<br>❊ ජේසුස් වහන්සේ අනාගතයේ දී සිදු කරන දිවි පිදීම නිසා මවක ලෙසට මරිය තුමිය විඳින්නට යන වේදනාව. | **ප්‍රකාශනයේ වැදගත්කම**<br>❊ මෙසියස් වහන්සේ ගැන දෙවියන් වහන්සේට තුති පිදීම.<br>❊ ජෙරුසලමේ විමුක්තිය බලා සිටි විජාතීන්ට, ජේසුස් වහන්සේ එම විමුක්තිදායකයාණන් බවට හඳුන්වා දීම. |

| මෙසියස් |
|---|
| මෙසියස් - හෙබ්‍රෙව් |
| ක්‍රිස්ටොාස්- ග්‍රීක් |
| (ගැලවුම්කරු - ආලේප ලත් තැනැත්තා) |

ජෙරුසලමේ දේව මාලිගාව තුළ දී ම සිමියොන්තුමා හා අන්නා දිවැසිවරිය බිළිඳු ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙස හඳුනා ගැනීම වැදගත් ය.

# දොළොස් වියේ දී ජේසුස් වහන්සේ දෙමාපියන් සමගින් ජෙරුසලම් දේව මාලිගාවට යෑම

ජුදෙව් පාස්කුව සමරන විට දී හැකි සෑම ජුදෙව්වකු ම ජෙරුසලම් දේව මාලිගාවට පැමිණිය යුතු බව ද වසරකට තුන් වරක් වත් මංගල්‍යය සැමරුම්වලට සහභාගි වීමට පැමිණිය යුතු බව ද කියා නික්මයාම පොතේ නියමයක් තිබේ.

ජුදෙව් සමාජය විසින් පිරිමි දරුවන් වයස අවුරුදු 12 දී වැඩිහිටියන් ලෙසට පිළිගනු ලැබේ. එවිට ඔවුන් ව දේව මාලිගාවට ගෙනෙන අතර, ටෝරාව ලෙස හඳුන්වනු ලැබූ ජුදෙව් ව්‍යවස්ථාව ඉගෙනීමට ඔවුන්ට අවස්ථාව ලැබේ. මෙම වයසේ දී ඔවුහු දේව මාලිගාවේ දී පෙනී සිටිය යුතු ය. මෙම පිළිවෙත සම්පූර්ණ කිරීමෙන් ටෝරාව ඉගෙනීමට අවස්ථාව ඔවුන්ට විවෘත වේ. ඔහු ව්‍යවස්ථාවේ පුත්‍රයකු සේ ජුදෙව් ව්‍යවස්ථාවට යටත් ව ජීවත් වීමට බැඳීම සිදු වෙයි.

**ජුදෙව් පාස්කු මංගල්‍යය** -

**දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බැඳුමින් මුදවා ගෙන, මෝසෙස්ගේ නායකත්වය තුළින් කානාන් දේශයට ගෙන ඒමේ සිද්ධිය අනුස්මරණය කෙරේ.**

ඉහත නියෝග ඉටු කරනු වස්, මරියතුමිය ජෝසෙප්තුමා හා ජේසුස් වහන්සේ ඥාතීන් සමග නාසරෙත් නුවර සිට ජෙරුසලම් දේව මාලිගාවට පැමිණි සේක.

## එහි දී සිදු වූ විශේෂ සිද්ධීන්

**ජේසුස් වහන්සේ දේව මාලිගාවේ නතර ව සිටීම. එම නිසා මරියතුමිය හා ජෝසෙප්තුමා නැවත ජෙරුසලමට හැරී ඒම.**

**විශ්මිත දර්ශනයක් - ජේසුස් වහන්සේ දේව මාලිගාවේ පඬිවරුන් සමග වැඩ හිඳිමින්, ප්‍රශ්න විචාරමින්, සාකච්ඡා කරමින් සිටීම.**

මරියතුමිය තමන් සෙවූ බව දැක ජේසුස් වහන්සේ පැවසූ වදන් මේ සිද්ධියේ දී ඉතාමත් වැදගත් ය.

***ඔබ මා සෙවුවේ මන්ද ?***
***මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව***
***ඔබ නොදන්නෙහි ද ?***
***ශු. ලූක් 2: 49***

**ඉහත ප්‍රකාශන තුළින් වැදගත් කරුණු කිහිපයක් අනාවරණය වෙයි.**

1. ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ තම පියාණන් වහන්සේ බව හඳුනාගෙන, එය ප්‍රකාශ කළ බව.

2. ජේසුස් වහන්සේ ළමා කාලයේ සිට ම දේව රාජ්‍යයේ මෙහෙවර පිලිබඳ ව අවබෝධයෙන් යුතු ව ක්‍රියා කළ බව

මෙම සිදුවීමෙන් පසු ව උන්වහන්සේ නාසරෙත් නුවරට ගොස් දෙමාපියන්ට ඉතා කීකරු ව වැඩ සිටි බවත් පරිපූර්ණ පුද්ගලයකු සේ වැඩුණ බවත් වාර්තා වේ.

**ජේසුස් වහන්සේ, ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ද ප්‍රසාදය ලබමින් වැඩුණ සේක.**

**ශු. ලූක් 2: 52**

ජේසුස් වහන්සේගේ ළමා කාලය හා ඊට අදාළ සිදුවීම් සියල්ල අද ඔබ වැනි කිතුනු දරුවන්ට හා කිතුනු ජන සමූහයට මහත් ආදර්ශයකි.

ක්‍රියාකාරකම

1. ජුදෙව් ආගමික නියමයන් පිළිවෙළින් සටහන් කර, ඒවායේ ඉතිහාසගත පදනම් හඳුන්වා දෙන්න.

2. "මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද ?" ජේසුස් වහන්සේගේ මෙම ප්‍රකාශනයේ අර්ථය කුමක් ද ? ඉන් ඔබ ලබන පණිවුඩය ලියන්න.

3. ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ පවතින කිතුනු විශ්වාසයන් හා පටහැනි වන හා පටහැනි නොවන චාරිත්‍ර/සිරිත් විරිත් පිළිබඳ විවෘත සාකච්ඡාවක යෙදෙන්න.